**උතුරු නැගෙනහිර පළාත් සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2017**

---

උතුරු නැගෙනහිර පළාත් සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2009 නොවැම්බර් 08 දින එළඹි අංක 4728-එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ 2 උපලේඛනයේ II ආ වගන්තිය සහ 2014 මැයි 08 දින එළඹි අංක ටීඑෆ් 013787 දරන ප්‍රදාන ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

---

ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුම හා ප්‍රදාන ගිවිසුම අනුව, එවකට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වර්තමානයේ, පළාත් සභා, පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වනුයේ වගකිවයුතු හා ප්‍රතිචාර දැක්විය හැකි ආකාරයට උතුර, නැගෙනහිර, උතුරු මැද, වයඹ හා ඌව පළාත්වල පළාත් පාලන ආයතන විසින් ප්‍රාදේශීය සේවා බෙදාහැරීම් යාන්ත්‍රණයන් වැඩිදියුණු කිරීමයි. ගිවිසුම් ප්‍රකාරව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 12,942 කට සමාන එජඩො මිලියන 107 ක් වන අතර, ඉන් රු.මිලියන 8,530 කට සමාන එජඩො මිලියන 70.70 ක් ණයක් වශයෙන් හා රු.මිලියන 2,540 කට සමාන එජඩො මිලියන 20.30 ක් ප්‍රදානයක් වශයෙන් මූල්‍යායනය කිරීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් එකඟ වී තිබුණි. ඉතිරි අරමුදල් ශ්‍රී ලංකා රජය විසින් හා ප්‍රජා දායකත්වය මඟින් මූල්‍යායනය කිරීමට අපේක්ෂා කර තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2010 මැයි 01 දින ආරම්භ කරන ලද අතර, 2015 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට නියමිතය. පසුව, ව්‍යාපෘති කාලපරිච්ඡේදය 2017 අගෝස්තු 31 දක්වා දීර්ඝ කර තිබුණි. කෙසේ වුවද, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර තිබුණි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා

ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිතබව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍යයැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේ ද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම්, ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමග සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ අරමුදල් සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය හා ප්‍රදාන වලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව.

(ඈ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලංමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ) ණය හා ප්‍රදාන යටතේ ආපසු ගැනීම් මූල්‍ය හා ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේ ද යන බව.

(ඊ) ණය හා ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනා ගෙන තිබුණේ ද යන බව.

(ඌ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර තිබුණේ ද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේ ද යන බව සහ

(ඒ) මූල්‍ය හා ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේ ද යන බව.

**2. මූල්‍ය ප්‍රකාශන**

----------------

**2.1 මතය**

--------

මගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලංමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) මූල්‍ය හා ප්‍රදාන ගිවිසුම්වල නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව සහ

(ඉ) මූල්‍ය ගිවිසුමේ හා ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

## 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2017 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | මූල්‍ය සහ ප්‍රදාන ගිවිසුම් ප්‍රකාරව මූල්‍යයනය කිරීමට එකඟවූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම් | උපයෝජනය කළ අරමුදල් | |
|---|---|---|---|---|---|
| | | | | 2017 වර්ෂය තුළ | 2017 දෙසැම්බර් 31 දිනට |
| | එජඩො මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| ජාසංසං | | | | | |
| - ණය | 70.70 | 8,530 | 1,000 | 994 | 9,448 |
| - ප්‍රදාන | 20.30 | 2,540 | - | 176 | 2,540 |
| ශ්‍රීලංර | 14.00 | 1,662 | 200 | 32 | 1,643 |
| ප්‍රජා දායකත්වය | 2.00 | 210 | - | 25 | 539 |
| එකතුව | 107.00 | 12,942 | 1,200 | 1,227 | 14,170 |

## 3.2 භෞතික ප්‍රගතිය

--------------------

ලැබුණු තොරතුරු අනුව, ව්‍යාපෘතියේ සංරචක - 01 යටතේ රු.මිලියන 10,170 කට සමාන එජඩො මිලියන 90 ක ඇස්තමේන්තුගත මුළු පිරිවැයකට උතුර, නැගෙනහිර, වයඹ හා ඌව පළාත්වල පළාත් පාලන බල මණ්ඩල 101 ක විෂය පථය යටතේ ප්‍රදේශවල ව්‍යාපෘතිය විසින් ක්‍රියාත්මක කරන ලද මාර්ග සංවර්ධනය, පොදු උද්‍යාන හා වෙළඳපොළවල් ඉදිකිරීම, මලාපවහන හා කාණු පද්ධති පුනරුත්ථාපනය කිරීම් හා ග්‍රාමීය විදුලි බලය ලබාදීම් යනාදී යටිතල සංවර්ධන කාර්යයන් 2017 දෙසැම්බර් 31 දිනට සැලකිය යුතු දුරට නිමකර තිබුණි.

## 3.3 නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්

-------------------------------------------

රු.මිලියන 81.11 ක පිරිවැයකට උතුරු පළාතේ මුසලි ප්‍රාදේශීය සභාවේ කොන්ඩච්චි, සිලාවතුර, වෙප්පම්කුලම්, මරිච්චිකට්ටිහි සහ මන්නාරම ප්‍රාදේශීය සභාවේ උජිලන්කුලම්, පෙරියමඩු හා විඩතාල්තිවු හි ඉදිකරන ලද ළමා උද්‍යාන හා වවුනියා ප්‍රාදේශීය සභාවේ එරට්ටිපෙරියකුලම්, මහකච්චකොඩිය, පෙරියලුකුලම් හි ඉදිකරන ලද වෙළඳපොල ගොඩනැගිලි හා මුසලි ප්‍රාදේශීය සභාවේ සිලාවතුරහි ඉදිකරන ලද බස් නැවතුම්පොළ මහජනතාවගේ භාවිතයට නුසුදුසු අවිධිමත් ස්ථානවල අදාළ ඉදිකිරීම් සිදුකර තිබූ බැවින් 2017 දෙසැම්බර් 31 දිනට වර්ෂ 04 කට වැඩි කාලයක් භාවිතා කිරීමෙන් තොරව පැවතුණු බව ස්ථානීය පරීක්ෂා කිරීම්වලදී නිරීක්ෂණය විය.

## 3.4 පෙර විගණන වාර්තාවලින් පෙන්වා දෙන ලද නිරවුල් නොවූ විගණන කරුණු

----------------------------------------------------------------------------------------

මාගේ පෙර විගණන වාර්තාවලින්, පහත සඳහන් නිරීක්ෂණයන් කර තිබුණද එම කරුණු විමර්ශනය කිරීමට හා ඒ සඳහා වගකිව යුතු නිලධාරීන් හඳුනා ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(අ) උතුරු පළාතේ පළාත් පාලන ආයතන 03 ක් විසින් ලංසු ලියකියවිලිවල රේටයන් වෙනස් කිරීම මඟින් 2015 වර්ෂයේදී කරන ලද රු.මිලියන 4.42 වංචනික ගෙවීම පිළිබඳ විමර්ශනයන් සිදුකිරීම සඳහා පළාත් අරමුදලින් රු.මිලියන 1.5 ක මුදලක් ගෙවා තිබුණද ඒ සඳහා වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) වවුනියා දකුණ සිංහල ප්‍රාදේශීය සභාව විසින් සිදුකරන ලද පුනරුත්ථාපන වැඩ සඳහා ලංසුකරුවන් තෝරාගැනීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවේ සභාපති ලෙස ව්‍යාපෘති ඉංජිනේරුවරයා කටයුතු කර තිබූ අතර රු.මිලියන 4.2 ක පිරිවැයකට එම කොන්ත්‍රාත්තු ඔහුගේම සමාගමට ලබා දී තිබුණි. ඒ සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව කිසිඳු පියවරක් ගෙන නොතිබුණි.

## 3.5 ව්‍යාපෘතියේ කටයුතු වසා දැමීම

--------------------------------

ව්‍යාපෘතියේ කටයුතු 2017 අගෝස්තු 31 දිනට වසා දමා තිබුණද, වසා දැමීමේ කටයුතු සඳහා මූලා ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය විසින් ව්‍යාපෘති නියාමන ඒකකයට නිකුත් කර නොතිබුණි.